NFX COMICS

Part II


THE FIRST SEAL

COLLECTOR'S ED.

YAKKA

The First Seal

Part II · The Pact of Ritigala




DIRECT EDITION

00121 · NFX CREATIONS


CREATED & WRITTEN BY

Nawod Madhuwantha. aka Nawwa.4X


Prequel to YAKKA: The Last Bloodline · Part II: The Pact of Ritigala



රිටිගල සොහොන් ගැබ
පාන්දර මීදුම මැද්දේ කලින් දවසේ ගිනි මැලය නිවිලා ගිහින් තිබුණා. හාමුදුරුවෝ නවිවාට කතා කරලා අඳුරු ගල් ලෙන ඇතුළට එක්කගෙන ගියා.


ලෙන ඇතුළේ ගිනි පන්දම් එළියෙන් පරණ ගල් කැටයමක් මතු වුණා. දණගහගෙන ඉන්න තරුණ කුමාරයෙක්, යක්ෂ සෙන්පතියෝ, සුදු වෙළඹක් සහ තරු තුනක් යට තියෙන ගල් කණු තුනක් ඒකේ කොටලා තිබුණා.
හාමුදුරුවෝ
"අනුරාධපුරයේ පළවෙනි රජතුමා තමන්ගේ කිරුළ දිනාගත්තේ තනියම නෙවෙයි පුතේ."


නවිවා
"මේ කොටලා තියෙන්නේ... යක්ෂයෝ නේද?"
හාමුදුරුවෝ
"ඔව්... එදා එයාව රජ කළේ මේ යක්ෂ පරපුර තමයි."







හාමුදුරුවන්ගේ හඬ
"කාලයකට පස්සේ මුහුදෙන් අලුත් මිනිස්සු පිරිසක් මේ දූපතට ගොඩ බැස්සා. අපේ යක්ෂ පරපුර එයාලට උදව් කළත්, අන්තිමට ලැබුණේ මහා පාවාදීමක් විතරයි."





දුර්වල වන ආවරණය
"කාලය ගෙවෙද්දී අර ආරක්ෂක ගල් කණු ටිකෙන් ටික පුපුරලා ගියා. පොළොව වහගෙන තිබුණු ආවරණයත් දුර්වල වුණා."




එක්ටැමි ගෙය
නැකැත්කරුවන්ගේ අනාවැකියට බය වුණු සහෝදරයෝ දස දෙනා, චිත්‍රා කුමරියව එක්ටැමි ගෙයක හිර කරලා තිබ්බා.
බ්‍රාහ්මණ නැකැත්කරු
"මේ කුමරියගේ කුසෙන් ඉපදෙන පුතා, මතු දවසක රජකම වෙනුවෙන් තමන්ගේ මාමලා ඔක්කොම මරා දානවා!"


කුමාරයා ඉපදුණු එදා රෑම සේවිකාවක් දරුවාව කුඩයක දාගෙන කැලේ මැදින් පැනලා ගියා. මාමලාගේ සෙබළු පාර හරස් කරද්දීම, කැලෙන් කඩා පැනපු යෝධ වල් ඌරෙක් උන්ව වෙන පැත්තකට ඇදගෙන ගියා.
KRA-SHHHH!!


කාලවේල
"මිනිස්සු අපිව පාවා දීලත්... අපි මේ මිනිස් දරුවෙක්ව බේරගන්නේ ඇයි?"
චිත්තරාජ
"මේ දරුවා හදන නගරය ඉදිවෙන්නේ අපේ ගල් කණු උඩයි. ඒ නිසා මේ දරුවා කොහොමහරි ජීවත් වෙන්නම ඕනේ."

අවුරුදු හතේදී, සෙබළු ගිනි පන්දම් අරන් හොයද්දී පොකුණක දිය යට ගස් බෙනයක හැංගිලා ජීවිතේ බේරගත්තා.

අවුරුදු දොළහේදී, එඬේර ගම්මානය ගිනි ගනිද්දී අඳුර මැදින් කැලෑවට පැනලා දිව්වා.

පණ්ඩුල බ්‍රාහ්මණතුමා
"කුමාරයාණෙනි, ඔබ අවුරුදු හැත්තෑවක් මේ රටේ රජ කරනවා!"

නුම්බරියංගණ පොකුණ. තරුණ වියට පත්වුණු පණ්ඩුකාභය කුමාරයා, රතු පාට කුර තියෙන අද්භූත සුදු වෙළඹව තමන්ගේ තොණ්ඩුවට හසු කරගත්තා!

SNAP-CRACK!!

කුමාරයා වෙළඹගේ කේසර අල්ලද්දීම, වතුරේ වැටුණු සෙවණැල්ලෙන් පෙනුණේ අශ්වයෙක් නෙවෙයි, චේතියා යක්ෂණියවයි!

චේතියා
"මාව මෙල්ල කරපු පළවෙනි මිනිසා ඔබයි... දැන් රිටිගල කන්දට යන්න."


රිටිගල වටලෑම
මහාවංශයේ සඳහන් වන ලෙසට, මාමලා අට දෙනාගේ මහා සේනාවන් ඇත්, අස්, පාබල හමුදා එක්ක රිටිගල කන්ද වට කරගත්තා.
කඳවුර ඇතුළේ අඳුරු පූජකයා ලොකු මාමාගේ කනට රහස් කොදුරද්දී, කුමාරයාගේ දූතයෝ සාම තෑගි විදිහට රාජකීය ඇඳුම් සහ ආයුධ ගෙනත් දුන්නා.
වැඩිමහල් මාමා
"කොල්ලා බයවෙලා අපිට යටත් වුණා!"
පණ්ඩුකාභය
"දැන් පහර දෙන්න!"
SHRIEEEEK!!
චිත්තරාජ
"වෙස්මුහුණු පළඳින්න!"
රිටිගල යක්ෂ සේනාව
කුමාරයාගේ සෙබළු කන්දෙන් පහළට කඩා පනිද්දීම, කළු ගල් අතරින් යක්ෂ සේනාව මතු වුණා! පළවෙනි මහා යුද්ධයෙන් පස්සේ පළවෙනි වතාවට යක්ෂයෝ මිනිස්සු එක්ක එකට සටනට බැස්සා!
KLAK-IGNITE!!



ආරක්ෂකයන්ගේ ප්‍රහාරය
චිත්තරාජ ඉස්සරහට ආපු යුද ඇතාව අතින්ම හරවලා යැව්වා! කාලවේල සතුරු පලිහ පෙළ කුඩු කරද්දී, සුදු වෙළඹ පිටින් ආපු කුමාරයා සතුරු හමුදාව මැදින් කඩාගෙන ගියා!
KRA-SMASH!!
අඳුරු බලය බිඳීම
අඳුරු පූජකයා මාර යානයේ කළු යකඩ කැබැල්ල උස්සද්දීම, චිත්තරාජ ඒක තමන්ගේ අතින්ම පොඩි කරලා දැම්මා!
KRA-CRUNCH!!
ඒ එක්කම සෙබළුන්ගේ ඇස්වල තිබුණු රතු අඳුර මැකිලා ගියා. කලින් තමන්ගේ අම්මට උදව් කරපු ලොකු මාමා ඉස්සරහා කුමාරයා අත උස්සලා සෙබළුන්ව නැවැත්තුවා.
පණ්ඩුකාභය
"අභය මාමාට කවුරුත් අත තියන්න එපා!"


මුද්‍රාවේ කුටිය
එදා රෑ රිටිගල ලෙන ඇතුළේදී, නාපසතුමා පරණ වෙස්මුහුණ අතේ තියාගෙන ඉද්දී චිත්තරාජ කුමාරයාව සක්වල චක්‍රය ඉස්සරහට එක්කගෙන ගියා.
චිත්තරාජ
"අපි ඔබව මේ රටේ රජ කරනවා."
පණ්ඩුකාභය
"ඒ වෙනුවට මගෙන් මොනවද වෙන්න ඕනේ?"
චිත්තරාජ
"ඔබේ පරම්පරාව මේ ගල් කණු තුන උඩ භක්තියේ මහා කඳු ගොඩනඟන්න ඕනේ."
රජෙක්. ගෝත්‍රයක්. පොරොන්දුවක්.
මිනිස් රජතුමයි, යක්ෂ සෙන්පතියයි, නාපසතුමයි තුන්දෙනාම වෙස්මුහුණ උඩ අත් තියලා දිවුරුම් දුන්නා!
පණ්ඩුකාභය
"මම ඒ පොරොන්දුව ඉෂ්ට කරනවා!"
වෙස්මුහුණේ නිල් ආලෝකය බිත්තියේ සිතියම පුරා විහිදෙද්දී, කාලවේලත් චේතියාත් යක්ෂ සේනාවත් අලුත් රජතුමා ඉස්සරහා දණ නැමුවා.


හාමුදුරුවන්ගේ හඬ
"එතුමා අහසේ පෑයූ අනුරාධ තරුවේ නමින් අලුත් නගරය නම් කළා... හැබැයි ඒ නගරය හැදුවේ මහා රහසක් උඩයි."


රහස රකින ආරක්ෂකයෝ
නගර ප්‍රාකාරයයි අභය වැවයි ඉදිවෙද්දී, පොළොව යට තිබුණු ගල් කණු තුන මුර කරන්න බටහිරින් චිත්තරාජත්, නැගෙනහිරින් කාලවේලත් නතර වුණා. පළවෙනි ගල් කණුව උඩ රන් තෙළඹු ගසක් වැවුණා.


ඒ රන් තෙළඹු ගසේ මුල් පොළොව යට ගල් කණුව වටා එතේද්දී, දේව ගෝත්‍රයේ ස්වර්ණමාලී දේවිය ගසෙන් මතු වුණා.
ස්වර්ණමාලී
"මම මේ උතුම් බිම ආරක්ෂා කරනවා."


උත්සව දවස්වලදී පණ්ඩුකාභය රජතුමයි චිත්තරාජයි එක සමාන ආසන දෙකක එකට වාඩි වුණා. ඒ ගිවිසුම කෙටූ රන් පතක් රාජකීය කරඬුවක තැන්පත් කළා.



හාමුදුරුවන්ගේ හඬ
"පරම්පරා ගාණකට පස්සේ... මුහුදෙන් එතෙර ඉඳන් උතුම් හඬක් ආවා. 'අනාගතයේ පහළ වන රජ කෙනෙක් මේ බිමේ මහා සෑයක් ගොඩනඟනවා' කියලා."

"දේවානම්පියතිස්ස රජතුමා ඒ ගස ළඟ ගල් ටැඹක් පිහිටුවලා, ඒ අනාවැකිය ලියපු රන් පතත් අර පරණ යක්ෂ රන් පත ළඟින්ම තැන්පත් කළා. ඒ දෙකෙන්ම පෙන්නුවේ එකම බිමයි!"

නව්වා
"එතකොට එයාලා මුළු රාජධානියක්ම හදලා තියෙන්නේ ඒ පොරොන්දුව රකින්නයි!"

හාමුදුරුවෝ
"ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න අවුරුදු පන්සියයක් ගියා පුතේ... එක රජ කෙනෙක් ඒ වෙනුවෙන් තමන්ගේ හැමදේම කැප කළා."

සැඟවුණු සතුරා
මුදාව බිඳුණු එදා රාත්‍රිය. සක්වල චක්‍රය කැණීම් කරපු තැන හිටපු නරුණ පුරාවිද්‍යා සහායකයා කණ්ඩායමෙන් ඈත් වෙලා යන්ත්‍රය දිහා බලාගෙන හිනා වුණා... ඔහුගේ ඇස් රතු සහ කළු පාටින් දිලිසුණා!

TICK... TICK... TICK...

මාර පණිවිඩය
"තේ වෝරා නෙත්'කාල්..."

දෙවන කොටස නිමයි. තුන්වන කොටසින් හමුවෙමු:
PART III — THE WAR OF THE GIANTS